# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# සහන නිවේදකයින්ගේ සේවය ලබගැනීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් පවත්වනු ලබන ලොතරැයි දිනුම් ඇදීම් පිළිබඳ රූපවාහිනී වැඩසටහන් වලදී නිවේදක කටයුතු (සිංහල/ දෙමළ) කිරීමට හැකි පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති වයස අවුරුදු 30ට අඩු සහන නිවේදක/ නිවේදිකාවන්ගෙන් (පළපුරුදු/ආධුනික) අයදුම්පත් කැඳවනු ලැබේ.

- අ.පො.ස(සා.පෙළ) විභාගයේදී භාෂාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් සමත්වී තිබිය යුතුවීම සහ කාන්තා නිවේදිකාවන් සිත්ගන්නා සුළු පෙනුමක් හා පිරිමි නිවේදකයින් මනා පෞර්ෂත්වයක් තිබිය යුතුයි.
- පිරිමි අපේක්ෂකයන්ගේ උස අඩි 5 අගල් 6කට සහ ගැහැනු අපේක්ෂකයන්ගේ උස අඩි 5 අගල් 2 කට නොඅඩු විය යුතුයි.
- නිවේදක කටයුතු කිරීමට අපේක්ෂිත භාෂාව චතුර ලෙස හැසිරවීමට හැකිවිය යුතුයි.
- අ.පො.ස උසස් පෙළ සමත්ව තිබීම හා භාෂා එකකට වඩා වැඩි ගණනකින් නිවේදන කිරීමට ඇති හැකියාව සහ සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ දැනුවත් බව අතිරේක සුදුසුකම් ලෙස සැලකේ.
- ලොතරැයි දිනුම් ඇදීම රාත්‍රී කාලයේදී කොළඹදී සිදුකරන බැවින් ඊට සහභාගී වීමට හැකි අයවළුන් විය යුතුයි.
- සුදුස්සන් තෝරාගනු ලබන්නේ නිවේදක හැකියාව මැනීමේ පරීක්ෂණයකින්, සම්මුඛ පරීක්ෂණයකින් හා තිර පරීක්ෂණයකින් අනතුරුවයි.
- මෙය ස්ථිර හෝ තාවකාලික තනතුරක් නොවන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී නිවේදක කටයුතු සඳහා යොදවාගන්නා අයට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන දීමනාවක් පමණක් ගෙවනු ලැබේ.
- තෝරාගන්නා ලද සහන නිවේදකයින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමග වාර්ෂික ගිවිසුමකට එළඹිය යුතු අතර, ගිවිසුමේ කොන්දේසි අනුව ක්‍රියා කළ යුතුය.
- නම, උපන් දිනය, ස්ථිර පදිංචි ලිපිනය, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා නිවේදක කටයුතු කිරීමට හැකි භාෂා මාධ්‍යය, ස්ත්‍රී/ පුරුෂ භාවය, උස යන කරුණු ඇතුළත්ව ඔබ විසින් සකස් කරගත් අයදුම්පත්‍රයක් සහ මෑතකදී ගන්නා ලද සම්පූර්ණ රුව සහිත තැපැල්පත් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් සමඟ 2024.12.28 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. ලියුම් කවරයේ වම්පස ඉහළ කොටසේ ඔබ නිවේදන කටයුතු කිරීමට අපේක්ෂිත භාෂා මාධ්‍ය හා **"සහන නිවේදකයින් බඳවා ගැනීම"** යන්නෙන් සඳහන් කළ යුතු වේ.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි),**
**සංවර්ධන ලොතරැයි මණ්ඩලය,**
**නො.356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,**
**යූනියන් පෙදෙස, කොළඹ 02.**